# PRIME ENTRY BOOKS (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# සුළු මුදල් ගෙවීම් ජර්නලය

ව්‍යාපාරයක දෛනික ව සිදු වන ගනුදෙනු අතර, සුළු වටිනාකම් සහිත ගනුදෙනු හඳුනා ගෙන ඒවා වෙන ම මූලික සටහන් පොතක සටහන් කළ යුතු ය. එම මූලික සටහන් පොත, සුළු මුදල් ගෙවීම් ජර්නලය ලෙස හැඳින්වේ.

විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් ගෙවීම් ජර්නලයක සුළු වියදම් ගෙවීම් ඇතුළත් කරයි.

# සුළු මුදල් ගෙවීම් වවුචරය

සුළු මුදල් ගෙවීම් ජර්නලයේ ගනුදෙනු වාර්තා කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන, සුළු මුදල් ගෙවීම් වවුචරය වේ.

ClassWork.LK

## සුළු මුදල් අග්‍රිමය

සුළු ගෙවීම් සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වේ යැයි කළමනාකරණය තීරණය කළ මුදල සුළු මුදල් අග්‍රිමය වේ. ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට මෙම මුදල ලබා දෙයි.

## සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය

අග්‍රිමය අවසාන වීමට ආසන්නයේ දී සුළු මුදල් භාරකරු විසින් ගෙවන ලද මුදල ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලබා ගැනීම අග්‍රිමය ප්‍රතිපූරණය නම් වේ.

ClassWork.LK

## සුළු මුදල් ගෙවීම් ජර්නලය හා පොදු ලෙජරයේ සටහන් කරන ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන්

### සුළු මුදල් අග්‍රිමය ලැබීම

මෙය ගෙවීම් ජර්නලයේ වාර්තා කිරීමෙන් අනතුරුව පහත පරිදි ගිණුම්ගත වේ.

| | | | |
|---|---|---|---|
| සුළු මුදල් ගිණුම | හර | | |
| | | මුදල් ගිණුම | බැර |

### අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම

| | | | |
|---|---|---|---|
| සුළු මුදල් ගිණුම | හර | | |
| | | මුදල් ගිණුම | බැර |

### සුළු වියදම් තීරුවල එකතුව

| | | | |
|---|---|---|---|
| ඒ ඒ වියදම් ගිණුම් | හර | | |
| | | සුළු මුදල් ගිණුම | බැර |

ClassWork.LK

# සුළු මුදල් ගෙවීම් ජර්නලය සකස් කළ හැකි ආකාරය

## සුළු මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | ව.අ | ගෙවීම් | විශ්ලේෂණ තීරු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සංග්‍රහ | තැ.පැ. | ගමන් | පිරිසිදු | වෙනත් | ලෙ. |
| 3/4 | සංග්‍රහ | 01 | 200 | 200 | | | | | |
| 3/5 | මුද්දර හා ලියුම් කවර | 02 | 180 | | 180 | | | | |
| 3/6 | පිරිසිදු කිරීම් | 03 | 300 | - | - | - | 300 | | |
| 3/8 | තැපැල් ගාස්තු | 04 | 300 | | 300 | | | | |
| 3/9 | කුලී රථ ගාස්තු | 05 | 250 | | | 250 | | | |
| 3/10 | රනිල් (ණයගිම්) | 06 | 600 | | | | | 600 | 08 |
| 3/11 | පිරිසිදු කිරීමේ වියදම් | 07 | 150 | | | | 150 | | |
| | | | 1 980 | 200 | 480 | 250 | 450 | 600 | |
| | | | | සංග්‍රහ වියදම් ගිණුමට හර කළා (ලෙ.පි. 20) | තැපැල් වියදම් ගිණුමට හර කළා (ලෙ.පි. 21) | ගමන් වියදම් ගිණුමට හර කළා (ලෙ.පි. 23) | පිරිසිදු කිරීමේ ගිණුමට හර කළා (ලෙ.පි. 24) | | |

ClassWork.LK

# සුළු මුදල් පොතේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කරන ආකාරය

**සුළු මුදල් ගිණුම**

| | රු |
|---|---|
| 3/1 මුදල් ගිණුම 2 500 | විවිධ ගිණුම් 1980 |

**මුදල් ගිණුම**

| රු | රු |
|---|---|
| 31/1 ඉ/ගෙ ශේෂය × × × | 3/1 සුළු මුදල් 2 500 |

**සංග්‍රහ ගාස්තු ගිණුම**

| රු | රු |
|---|---|
| 3/15 සුළු මුදල් 200 | |

**තැපැල් වියදම් ගිණුම**

| රු | රු |
|---|---|
| 3/15 සුළු මුදල් 480 | |

**පිරිසිදු කිරීමේ වියදම්**

| රු | රු |
|---|---|
| 3/15 සුළු මුදල් 450 | |

**ගමන් වියදම් ගිණුම**

| රු | රු |
|---|---|
| 3/15 සුළු මුදල් 250 | |

**ණයහිමි පාලන ගිණුම**

| රු | රු |
|---|---|
| 3/10 සුළු මුදල් 600 | ශේෂය × × ×<br>ඉ/ගෙ |

ClassWork.LK

## අභ්‍යාස

(01) සුළු මුදල් අග්‍රිමය හා සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කෙටියෙන් පැහැදිලි කරන්න.

(02) සුළු මුදල් ගෙවීම් ජර්නලයක සටහන් කෙරෙන පහත ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන සඳහන් කරන්න.

සුළු මුදල් අග්‍රිමය ලැබීම
සුළු වියදම් ගෙවීම්

(03) ව්‍යාපාරයක මාසික සුළු මුදල් අග්‍රිමය රු. 3 000 කි. 2017 ජනවාරි මාසය තුළ දී සිදු කරන ලද සුළු වියදම් ගෙවීම්වල එකතුව පහත පරිදි වේ.

| | |
|---|---|
| ලිපි ද්‍රව්‍ය වියදම් | 120 |
| ගමන් වියදම් | 240 |
| සංග්‍රහ වියදම් | 300 |
| තැපැල් වියදම් | 450 |
| විවිධ වියදම් | 900 |

2017/01/31 දිනට සුළු මුදල් පොතේ ඉදිරියට ගෙන ගිය ශේෂය වන්නේ ?

රු. 990 කි. රු. 3 000 කි. රු. 5 010 කි.
රු. 2010 කි. රු. 3 990 කි.

ClassWork.LK

(4) සත්සරණී ව්‍යාපාරයේ 2017/04/01 දිනට පැවති ශේෂයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| මුදල් පාලන ගිණුමේ ශේෂය | රු. 24 000 |
| විමුක්ති (ණය හිමි) | රු. 2 500 |
| මාසික සුළු මුදල් අග්‍රිමය | රු. 2 000 |

2017 අප්‍රේල් මාසය සඳහා සුළු මුදල් අග්‍රිමය 2017.04. 01 දින සුළු මුදල් භාරකරුට ලැබුණි.

සුළු මුදල් භාරකරු විසින් අප්‍රේල් මාසය සඳහා සිදු කළ සුළු වියදම් ගෙවීම්වල එකතුව පහත දැක්වේ.

| | රු. |
|---|---|
| සංග්‍රහ වියදම් | 265 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 315 |
| තැපැල් වියදම් | 340 |
| විමුක්තිට ගෙවීම් | 300 |
| ගමන් වියදම් | 160 |

අවශ්‍ය වන්නේ :- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කළ ගනුදෙනු 2017/04/30 දිනට ලෙජරයට පිටපත් කිරීම.

ClassWork.LK

(05) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

සුළු මුදල් ගෙවීම් ජර්නලයක් වෙන ම පවත්වා ගැනීමෙන් සුළු මුදල් ගනුදෙනුවල පාලනයක් පවත්වා ගත හැකි වේ. (        )

සුළු මුදල් ගෙවීම් ජර්නලය මූලික සටහන් පොතක් මෙන් ම ලෙජර් ගිණුමක් ලෙසට ද කටයුතු කෙරේ. (        )

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura